

# යන්න එපා හිතන්න !
# වෙනදේ මෙන්න

- දොරකඩ මාරයා පෙනි පෙනී රුසියානු හමුදාවට යන ලාංකිකයෝ
- රුසියානු-යුක්රේන යුද්ධයෙන් දැනටම ලාංකික සෙබළුන් 5ක් මරුට
- මාසික වැටුප ලක්ෂ 9ක් නෙවෙයි, ලක්ෂ හතහමාරයි
- රුසියාවට ගියොත් පහසුවෙන්ම බැඳෙන්න පුළුවන්



ප්‍රියන්ත හෙට්ටිගේ

**'යුක්රේනයට එරෙහිව රුසියානු හමුදාව සඳහායි අපි සේවය කළේ. මුලින් අපිට ලොකු අනතුරුදායක තත්ත්වයක් එතරම්ම පෙනෙන්න තිබුණේ නෑ. අපි බොහෝ වෙලාවට බංකර්වල රාජකාරි සඳහා තමයි ගියේ. ඩොනෙට්ස්ක් (Donetsk) කියන ප්‍රදේශයේ තිබෙන බංකර් සඳහා අපි ගියා. මෙතැන අපිට ප්‍රහාරයක් එල්ල වන බවක් පෙනෙන්නවත් තිබුණේ නැහැ. එහෙත් පසුව එක්වරටම හිතාගන්නවත් බැරි විදියට ඩ්‍රෝන ප්‍රහාර එල්ල වන බවක් පෙනෙන්න තිබුණා. බංකර් දෙකකට විතර ප්‍රහාර එල්ල වුණා කියලා දුරකතන පණිවුඩ ආවා. අපි ඒ සමගම සීරුවෙන් සිටියා. ඒත් සිතාගන්න බැරි විදියට එකපාරටම අපේ බංකරයටත් ඩ්‍රෝන ප්‍රහාරයක් එල්ල වුණා. යුක්රේන ඩ්‍රෝන යානාවකින් වරුසාවක් වගේ වෙඩි ඇදහැලෙන්න ගත්තා. මමයි නිපුණයි එකට සිටියේ. අපට මොනවා වුණාදැයි හිතාගන්න බැරිවුණා. එක්වරම අපි දෙන්නටම ඩ්‍රෝන වෙඩි ප්‍රහාරයන් එල්ල වුණා. මම දැක්කා සැණෙකින්ම වෙඩි ප්‍රහාර කිහිපයක් වැදිලා නිපුණ බිම ඇදගෙන වැටෙනවා. මටත් වෙඩි වැදුණා. ඒත් හුඟක් දරුණු වුණේ නැහැ. මගේ අතක් සහ කකුලක් විතරක් තුවාල වුණා. ඒත් නිපුණ....'**

කුමක්ද මේ ශෝකබරිත එසේම ආවේගාත්මක වගතුග? මෙම කතාව අපට අසන්නට ලැබුණේ මෙයට දින කිහිපයකට ඉහතදීය. අපගේ ශ්‍රී ලංකාවට සැතපුම් දහස් ගණනක් ඈතින් එය ඇසෙන්නට විය. එම ශෝකීය කතාව කියා සිටින්නේ කවුදැයි පැවැසීමට පෙර අප තවදුරටත් ගලා යන එම වදන් පෙළ අසා සිටිමු.

'ඔව්, ඒත් නිපුණ වෙඩි වැදිලා බිම ඇදගෙන වැටුණා. ඔහුගේ පපු ප්‍රදේශයට වෙඩි වැදිලා තිබෙනවාට අමතරව අත්පාවලටත් වෙඩි වැදිලා තියෙනවා මම දැක්කා. පපුවට දරුණු ලෙස වෙඩි දෙක තුනක්ම වැදිලා ලේ ගලනවා පෙනුණා. මම වහා ඉදිරියට පැනලා ඔහු අල්ලා වත්තන් කරගත්තා. නිපුණගේ තත්ත්වය හුඟක්ම නරක බව මට පෙනුණා. අප සිටි බංකරය වෙඩි පහරින් ගිනිගෙන දැවෙන්න වුණා. ඩ්‍රෝන යානය එම ප්‍රහාරය එල්ල කර එතැනින් ඉවත්ව ගියා. එහෙත් දෙවැනි ප්‍රහාරය සඳහා නැවත එහි පැමිණිය හැකියි. මම නිපුණ වත්තන් කරගෙන අපගේ අනෙක් සොල්දාදුවන් සිටින බංකරය පැත්තට ගියා. එහෙත් විනාඩි දෙක තුනයි ගියේ. ඩ්‍රෝන යානය පැමිණ නැවත ප්‍රහාරයක් එල්ල කළා. වෙඩි වරුසාවක් එල්ල වුණා. මම නිපුණව ආරක්ෂිත ස්ථානයක් වෙත ගෙනයන්න උත්සාහ කළා. ඒත් ඒක මට කරන්න බැහැ. මගේ අත්පාවලටත් වෙඩි වැදිලා තිබුණේ. නිපුණ බොහෝ අසාධ්‍ය තත්ත්වයකින් සිහි නැතිව සිටියේ. නැවත වරක් ඩ්‍රෝන ප්‍රහාරයක් එල්ල වෙන්න පුළුවන්. මට වෙන කරකියා ගන්න දෙයක් නැහැ. නිපුණ හැරයෑම තරම් වෙන විකල්පයක් තිබුණේ නැහැ. මම බොහෝ දුකෙන් ඔහු හැරගෙ ාස් ආරක්ෂිත ස්ථානයකට පැමිණියා. මමත් වෙඩි වැදිලා හරිම වේදනාවෙන් සිටියේ. ඊට පස්සේ නිපුණට මොනවා වුණාදැයි මම දන්නේ නැහැ. අපේ රුසියානු හමුදාවේ සාමාජිකයන් තැන් තැන්වල විසිරී සිටියා....'

මෙම ත්‍රාසජනක කතාව කියා සිටින්නේ සේනක බණ්ඩාරය. එසේ නම් ඔහු කවරෙක්ද? සේනක බණ්ඩාර යනු දැනට 36 වැනි වියේ පසුවන ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කළ සාමාජිකයෙකි. වසර ගණනාවක එම සේවයෙන් පසුව ඔහු ඉන් ඉවත්ව ගොස් දැන් සේවය කරන්නේ රුසියානු යුද හමුදාවටය. දැනට වසර දෙකකට පෙර ආරම්භ කර තෙවැනි වසරටද එළැඹ තිබෙන රුසියානු-යුක්රේන යුද්ධයට සම්බන්ධව ඔහු මීට මාස කිහිපයකට පෙර රුසියානු හමුදාවට බැඳීමට කටයුතු කළේය. මෙලෙස මේ වනවිට ශ්‍රී ලාංකික හමුදා සාමාජිකයන් විශාල පිරිසක් නොයෙකුත් මාර්ගයන් හරහා රුසියාවට ගොස් එරට හමුදාවට බැඳී සිටිති. සේනක බණ්ඩාරත් පසුගියදා මෙම ප්‍රකාශය සිදුකර තිබුණේ ලොව ප්‍රකට මාධ්‍ය සේවයක් වන 'අල් ජසීරා' (Al-Jazeera) රූපවාහිනිය වෙතය. ඔහු මෙහිදී විස්තර කරනු ලබන හමුදා සාමාජිකයා නිපුණ සිල්වා නමැති 27 හැවිරිදි තරුණයෙකි. ඔවුන් දෙදෙනා පසුගියදා රුසියානු - යුක්රේන යුද්ධය සඳහා රුසියානු හමුදාව නියෝජනය කරමින් සිටියදී මෙම ඛේදජනක සිදුවීමට මුහුණපා ඇත. මෙම බියකරු සිදුවීමේදී නිපුණ සිල්වා නමැති ශ්‍රී ලාංකික හමුදා සාමාජිකයා මියයන්නට ඇතැයි කරුණු ප්‍රකාශ වෙයි. එනම් යුක්රේන ඩ්‍රෝන ප්‍රහාරයකින් ඔහු ඝාතනය වන්නට ඇතැයි විශ්වාස කෙරෙයි. එහිදී ඔහු සමග එකට සිටි අනෙක් සාමාජිකයා වන සේනක බණ්ඩාර ඩොනෙට්ස්ක් ප්‍රදේශයේ රෝහලක තුවාල ලබා ප්‍රතිකාර ගනිමින් සිටියදී ඉහත අත්දැකීම අල් ජසීරා රූපවාහිනිය වෙත ප්‍රකාශ කර ඇත. මියගිය නිපුණ සිල්වාගේ සිරුර පසුව ඔහු හා රුසියානු හමුදාවට සේවය කරන ශ්‍රී ලාංකිකයන් විසින් හඳුනාගෙන ඇති බව පැවැසෙයි. එහෙත් එම සිරුරු තවමත් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ පුවතක් ගැන වාර්තා වී නොමැත.

මෑතක සිට අපට අසන්නට ලැබුණු මෙම රුසියානු-යුක්රේන යුද්ධය සඳහා ශ්‍රී ලාංකික සොල්දාදුවන් සහභාගි වීමේ කතාන්දරය කුමක්ද? එම වගතුග සම්පූර්ණ සත්‍යයකි. ඉහත යුද්ධය ඇරැඹී දැනට වසර 2ක් ගතව ඇතත් මෙලෙස ශ්‍රී ලාංකික සොල්දාදුවන්ගේ වගතුග ඇසෙන්නට වී ඇත්තේ දැනට මාස 7-8ක පමණ කාලයක සිටය. රුසියානු හමුදාවට මෙන්ම යුක්රේන හමුදාවටද මෙලෙස ශ්‍රී ලාංකික සොල්දාදුවන් සේවය කිරීම මේ වනවිට සිදුවෙමින් පවතී. මේ අනුව ඉහත හමුදාවන්ට මෙම සොල්දාදුවන් අනුයුක්ත කරන්නේ ශ්‍රී ලංකා රජයේ හෝ එහි අනෙක් හමුදාවන්ගේ ඍජු මැදිහත්වීම මත නොවේ. ශ්‍රී ලංකා රජය දැනට දශක ගණනාවක සිට මෙරට හමුදා සාමාජිකයන් ලෝකයේ රටල් රැසක සේවය කිරීම සඳහා නිල වශයෙන් පිටත් කර යවා ඇත. එහෙත් එම බොහෝ අවස්ථාවලදී එම ක්‍රියාවලිය සිදුවන්නේ එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවේ මැදිහත්වීම මතය. එනම් මෙරට සොල්දාදුවන් එම විදේශීය රටවල තිබෙන විවිධ යුද අර්බුද සඳහා සේවය කරනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාව හරහාය. ඔවුන්ට වැටුප් ගෙවනු ලබන්නේද එක්සත් ජාතීන්ගේ සංවිධානය මගිනි. එහෙත් දැන් ශ්‍රී ලංකාවේ මේ වන විට අසන්නට ලැබෙන ඉහත කතාව බොහෝ වෙනස් එකකි. එනම් මෙරට සිටින හමුදාවෙන් විශ්‍රාම ගිය හෝ දැනට සේවයේ නියුතු හෝ හමුදා සාමාජිකයන් ශ්‍රී ලංකා රජයෙහි දැනුවත්භාවයකින් තොරව ඉහත රටවල් දෙකෙහි හමුදාවන්ට සම්බන්ධ වීමය. මෙහිදී මෙම හමුදා සාමාජිකයන් වෙනත් වක්‍ර ක්‍රම හරහා මෙරටින් පිටත්ව ගොස් එම රටවලට ඇතුළු වෙයි. එහිදී එය ප්‍රධාන වශයෙන් සිදුකරන්නේ සම්පූර්ණ හොර රහසේ වන අතර, ඒ සඳහා විවිධ රැකියා ඒජන්සිකරුවන් සහ වෙනත් රහසිගත පාර්ශ්වයන්ද සම්බන්ධ වෙයි. සැබැවින්ම එය පහසුවෙන් කළ හැකි ක්‍රියාවලියක්ද නොවේ.

එසේ නම් අප සොයා බැලිය යුත්තේ මෙලෙස යුද්ධය සිදුකරන රුසියාවේ සහ යුක්රේනයේ හමුදාවන්ට අපගේ ලාංකික හමුදා සාමාජිකයන් බඳවා ගන්නේද? සුවිශේෂ පුවත ඇත්තේ එතැනය. එනම් එම විදේශ හමුදාවන් දෙකම අපගේ හමුදා සාමාජිකයන්ට තම දොරටු විවෘත කර ඇත්තේ කිසිදු බාධාවකින් තොරවය. තවත් අයුරකින් කිවහොත් එම රටවල් දෙකම අපගේ හමුදා සාමාජිකයන් අතිශය කැමැත්තකින් යුතුව තම හමුදාවන්ට බඳවා ගනියි. මෙහිදී එම කාර්යය ඉතා පහසුවෙන් සහ වේගයෙන්ද සිදුකරනු ලබනු ලබන්නේ රුසියානු රජය විසිනි. එනම් දැනට යම් කාලයක සිට රුසියානු හමුදාවන්ට විදේශ රටවලින් කුලී හේවායන් (මර්සිනරීස් - Mercenaries) බඳවා ගැනීම සිදුකරනු ලබයි. ශ්‍රී ලාංකික හමුදා සොල්දාදුවන් බඳවා ගැනීම සිදුකරනු ලබන්නේද මෙම ක්‍රමවේදය යටතේය. යුද්ධයට මුහුණ දීමේ හදිසි අවශ්‍යතාව හේතුවෙන් රුසියානු රජය මෙම ක්‍රියාවලිය ඉතා කඩිනමින් ඉටු කරයි. මේ අතරම දැනට වසර 10ක සිට (2014දී අරඹන කරන ලද) ස්ථාපිත කර ඇති රුසියානු රජය විසින්ම පවත්වාගෙන යනු ලබන 'වැග්නර් ගෘප්' (Wagner Group) නමැති පුද්ගලික හමුදා සමාගමක්ද ඇත. මෙහි ප්‍රධානියා වන්නේ රුසියාවේ ජනාධිපති ව්ලැඩිමීර් පුටින්ගේ සමීප සගයකු වූ යෙව්ගිනි ප්‍රිගොෂින්ය. රුසියානු සන්නද්ධ හමුදාවන්ගේ යටිතල පහසුකම් භාවිත කරමින් ක්‍රියාත්මක වන මෙම සමාගමට කුලී හේවායන් විශාල ප්‍රමාණයක්ද සේවය කරති. එහෙත් මෙම කාලයේදී අපට ආරංචි වූ ශ්‍රී ලාංකික හමුදා සාමාජිකයන් එම සමාගමට සේවය නොකරන අතර, ඔවුන් සියල්ලක්ම ඍජුවම සේවය කරන්නේ රුසියානු යුද හමුදාවටය. එනම් පූර්ණ වශයෙන්ම රුසියානු රජයට සේවය කරයි.


මේ වන විට රුසියානු සහ යුක්රේන හමුදාවල ශ්‍රී ලාංකික සොල්දාදුවන් සිය ගණනක පිරිසක් සේවය කරනු ඇතැයි නිල නොවන ආරංචි මාර්ග සඳහන් කරයි. මෙහිදී බහුතර පිරිස ඇත්තේ රුසියානු යුද හමුදාව තුළ බවද පැවැසෙයි. රුසියානු හමුදාව හෝ යුක්රේන හමුදාව හෝ මෙම ලාංකික හමුදා සාමාජිකයන්ගේ ප්‍රමාණය හෙළිකර නැත. එහෙයින් එම රටවල ඇති ශ්‍රී ලාංකික තානාපති කාර්යාලයන් පවා මෙම ගණන් හිලව් නිසියාකාරව දන්නේ නැත. පසුගියදා එම තානාපතිවරුන් මෙම නිශ්චිත සංඛ්‍යාවන් ලබාදෙන ලෙස ඉල්ලීම් සිදුකර තිබුණත් එවැන්නක් සිදුවී නැත. එම සංඛ්‍යාවන් එම හමුදාවන් විසින් වසං කරන ආකාරයක් දැකිය හැකිය. මෙම පවතින යුද සමයේදී යම් ශ්‍රී ලාංකික හමුදා සාමාජිකයකු වෙනත් මාර්ගයකින් වීසා ලබාගෙන ඉහත රටවල් දෙක තුළට ගොස් සිටියහොත් ඔවුන්ට ඉතා පහසුවෙන් එම හමුදාවන්ට බැඳිය හැකිය. එනම් සාමාන්‍ය අධීක්ෂණයක් පමණක් සිදුකර කෙටිකාලීන හමුදා පුහුණුවක් ලබාදී එම පිරිස් හමුදා සඳහා අනුයුක්ත කරගනියි. මෙහිදී බොහෝ නිදහස්ව එම කටයුතු සිදුකරනු ලබන්නේ රුසියානු හමුදාව විසිනි. එයට හේතුව වන්නේ රුසියාවේ වත්මන් ජනාධිපති ව්ලැදිමීර් පුටින් විශේෂයෙන්ම ශ්‍රී ලාංකික සොල්දාදුවන් බඳවා ගැනීම කෙරෙහි පූර්ණ අවසරයක් ලබාදී තිබීමය. මෙහිදී තවත් හේතුවක් ලෙස ප්‍රකාශ වන්නේ රුසියාව සහ ශ්‍රී ලංකාව ඉතා සමීප මිත්‍ර රටවල් දෙකක් ලෙස පැවැතීමය. එය දශක කිහිපයක් පුරා පැවැතෙන්නකි. මෙම වටපිටාවේදී ශ්‍රී ලංකාව තවද නිල වශයෙන් රුසියානු-යුක්රේන යුද්ධය සඳහා සහභාගි වීමට මෙරට හමුදා සාමාජිකයන් යැවීම සිදුකර නැත. එහෙත් වක්‍ර ක්‍රම හරහා එය මේ වන විටද සිදුවෙයි. දැන් එසේ නම් මෙතරම් මරණය පෙනි පෙනී තිබියදීද ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන් මෙම හමුදාවලට බැඳෙන්නේ ඇයි?

ඔව්, මෙම කතාවේ හැරවුම් ලක්ෂ්‍යය උද්ගත වන්නේ එතැනදීය. එය වෙනත් කිසිවක් නොව මෙම විදේශීය හමුදා විසින් අපගේ හමුදා සාමාජිකයන් වෙත ගෙවනු ලබන මාසික වේතනයයි. එම ක්‍රියාවලියේදී ප්‍රමුඛස්ථානයේ සිටින්නේ රුසියානු හමුදාව සහ රුසියානු රජයයි. එනම් දැනට ශ්‍රී ලංකාවේ යම් පාර්ශ්ව විසිනුත්, මාධ්‍ය වාර්තා අනුවද ප්‍රකාශ වී ඇත්තේ අපගේ ශ්‍රී ලාංකික සාමාන්‍ය හමුදා සෙබළෙකුට රුපියල් ලක්ෂ 09ක් නොහොත් ඇමෙරිකානු ඩොලර් 3,000ක පමණ වැටුපක් ගෙවනු ලබන බවය. අප මෙම වගතුග රුසියානු හමුදා නිල වාර්තාවලට අනුව සොයා බැලුවෙමු. එහිදී අපට පෙනී ගියේ එතරම්ම සුවිශාල මාසික වැටුපක් නැතත්, එම සීමාවන්ට ආසන්න වන යම් ඉහළ වැටුපක් ගෙවන බවය. මෙහිදී හෙළිවන අනෙක් සුවිශේෂ කරුණ නම් එරට රුසියානු හමුදාවේ සේවය කරන නිත්‍ය සාමාන්‍ය සොල්දාදුවකුට ලැබෙන වැටුප විදේශීය හමුදා සාමාජිකයකුට වඩා හරි අඩක් පමණ වීමය. එම වගතුග අප වෙන් වෙන්ම සොයා බලමු.

★ රුසියානු යුද හමුදා සාමාන්‍ය සොල්දාදුවකුට ලැබෙන මාසික වැටුප රුසියානු රූබල් 160,000ක් නොහොත් ඇමෙරිකානු ඩොලර් 1,800ක් පමණ වෙයි. මෙය රුසියානු සාමාන්‍ය පුද්ගලයකු ලබන මාසික ආදායමට වඩා දෙගුණයක් වෙයි. එනම් රුසියානුවකුගේ සාමාන්‍ය දළ මාසික වැටුප රූබල් 71,500ක් නොහොත් ඩොලර් 750ක් පමණ වෙයි. මේ නිසා හමුදා ගෙවීම ඉහළින් ඇත.

★ රුසියානු හමුදාවට සේවය කරන විදේශීය යුද හමුදා සෙබළකුගේ මාසික වැටුප රූබල් ලක්ෂ 02ක් නොහොත් ඇමෙරිකානු ඩොලර් 2,200ක් පමණ වෙයි.





ඒ අනුව බලන කල අපගේ ශ්‍රී ලාංකික සොල්දාදුවන්ට සිතන තරම් මාසික වැටුපක් නොලැබෙන අතර, ඒ කෙසේ වුවද සමහර විට ඩොලර් 2,500කට ආසන්න මුදලක් ලැබීමට ඉඩ ඇත. ඒ නිසා මරණය නොතකා අපේ තරුණයන් එරට යුද්ධයට යන්නෙහිය.



# තුන්දෙනාම යාළුවෝ හිටියෙම එකට

# සෙල්ලම ලෙල්ලම වෙලා නැතිවුණු තරුණ ජීවිතයක්



**රැකියාව කරන අතරතුරේදීත් විහිළුවක් කරලා සතුටින් තමන්ගේ දවසේ රාජකාරිය කරන්න ඕනේ. ඒක අපි හැමෝම පිළිගන්න දෙයක්. දවස පුරාම දහසක් ප්‍රශ්නවලින් හෙම්බත් වෙලා පීඩනයෙන් ඉන්නවට වඩා සතුටින් සමගියෙන් කටයුතු කරන එක හැම අතින්ම හොඳ දෙයක්. නමුත් ඒ සතුට, ඒ විගිළුව කාටවත් හිරිහැරයක් නොවන විදියේ විගිළුවක් විම අත්‍යාවශ්‍යයි. ඉස්සර අපි කතාවට කිව්වේ 'ඇස් රතුවෙන විගිළු කරන්න එපා' කියලා. දැන් දැන් ඒ විගිළුවලින් ඇස් රතු වෙනවාටත් වඩා ජීවිතෙන් වන්දි ගෙවන්න වෙන තත්ත්වයක් තමයි උද්ගත වෙලා තියෙන්නේ.**

මේ කරුණ මතක් කරන්න හිතුවේ පසුගිය දවසක සපුගස්කන්ද මාබිම ප්‍රදේශයේ එක්තරා ආයතනයක සේවකයන් දෙදෙනකු විසින් තවත් සහෝදර සේවකයකුට විහිළුවට කළ දෙයක් නිසා එම සේවකයාගේ ජීවිතය අහිමිවී යෑම නිසයි. පසුගිය 25 වැනිදා අදාළ සේවකයන් දෙදෙනා විසින් එම ආයතනයේ තිබූ වායු අධි පීඩන යන්ත්‍රයක (කම්ප්‍රෙෂර්) වායු නළයක් තවත් සේවකයකුගේ ගුද මාර්ගයට අල්ලා ඇති අතර, එහිදී එම සේවකයාගේ බඩවැල් පුපුරා ගොස් අසාධ්‍ය තත්ත්වයේ පසුවූ ඔහු රාගම ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව 28 වැනිදා මියගොස් තිබුණා. මෙම අවාසනාවන්ත සිදුවීමෙන් ජීවිතය හැරගෙ ාස් තිබුණේ පානදුර අළුබෝමුල්ල අරැක්ගෙ ාඩ ප්‍රදේශයේ පදිංචිව සිටි හේෂාන් මධුශංක නැමති 24 හැවිරිදි තරුණයෙක්.

පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකිරීමෙන් අනතුරුව ඔහුගේ දේහය අළුබෝමුල්ලේ පිහිටි ඔහුගේ නිවෙස වෙත රැගෙන යනු ලැබුවා. මියගිය තරුණයාගේ පියා ජීවතුන් අතර නොමැති අතර, මව විදෙස් රැකියාවක නිරත වන බවත් දැනගන්නට ලැබුණා.

මියගිය හේෂාන්ගේ බාල සහෝදරිය තම සහෝදරයාගේ වියෝව දරාගැනීමට නොහැකිව හඬාවැටුණේ මෙලෙසින්.

'අපේ අයියා අපිව බලාගත්තේ තාත්තා කෙනෙක් වගෙයි. නිවාඩුවක් ලැබුණු හැම වෙලාවකම අපිව බලන්න එනවා. ඉගෙන ගන්න අපිට හරියට උදව් කළා. තාත්තා නැති අඩුපාඩුව අපිට දැනෙන්න දුන්නේ නැහැ. අම්මත් රට ඉන්නේ. එයාවත් ගෙන්න ගන්න ඕනේ. පුළුවන් කෙනෙක් ඉන්නවා නම් අම්මාව ගෙනල්ලා දෙන්න...'

ඔහුගේ පවුලේ ඥාතීන් හේෂාන් පිළිබඳ පවසා සිටියේ මෙවැන්නකි.

'හේෂාන්ට නංගි කෙනෙකුයි මල්ලි කෙනෙකුයි ඉන්නවා. මේ දෙදෙනාගේ බර කරට අරගෙන තිබ්බේ මේ සහෝදරයා. මේ පුතා බොහෝම අමාරුවෙන් තමයි ජීවිතය ගැටගහගත්තේ. මෙයාලාගේ අම්මා ආර්ථික අගහිඟකම් නිසා විදෙස්ගත වෙලා ඉන්නේ. මේ පුතාට යන්න එන්න අමාරු නිසා තැනක නැවතිලා තමයි රස්සාවට ගියේ. එයා රස්සාව කරන තැන යාළුවෝ දෙන්නෙක් එකතුවෙලා මේ වැඩේ කරලා තියනවා කියලයි කියන්නේ. අඩු වයසින් අපිව දාලා එයා යන්න ගියා. බොහෝම අමාරුවෙන් ජීවිතය ඉස්සරහට එන්න දඟලපු දරුවෙක්. ඒ ළමයට වෙච්ච දේ අපට හිතාගන්න බැහැ. ළමයි ගැන අවධානයෙන් ඉන්න. එයාලව දැනුවත් කරන්න. මේ වගේ විහිළු කරන්න යන්න එපා. මේ නැතිවෙච්ච දරුවා වෙනුවෙනුත් මේ ඉන්න දරුවෝ දෙන්නා වෙනුවෙනුත් අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා දරුවන්ගේ අම්මාව ලංකාවට ගෙනල්ලා දෙන්න කියලා...'

මේ සිදුවීමට අදාළ පුද්ගලයන් දෙදෙනා සපුගස්කන්ද පොලිසිය අත්අඩංගුවට ගනු ලැබුවා. ඔවුන් තිස්සමහාරාමයේ පදිංචිකරුවන් බවයි අනාවරණ වී තිබුණේ. 18 හැවිරිදි සැකකරුවන් අප්‍රේල් 05 වැනිදා දක්වා බන්ධනාගාරගත කර ඇත. සිද්ධිය සම්බන්ධයෙන් සපුගස්කන්ද පොලිස් ස්ථානාධිපති (ප්‍ර.පො.ප.) ඔසිත ලංකා ද සිල්වා මහතාගේ උපදෙස් අනුව අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති (උ.පො.ප.) ඩී.පී.එස්.එල්. මුතුකුමාරණ, (පො.සැ.) අබේරත්න (19334), පෙරේරා (32560), තිලකරත්න (36589), පුෂ්පකුමාර (55713), ගුණසේකර (67646) යන නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

මේ සිදුවීමෙන් අපි ඉගෙනගත යුතු පාඩම තමයි ජීවිතත් එක්ක සෙල්ලම් කරන්න හොඳ නැහැ කියන එක. හේෂාන්ගේ මිතුරන් දෙදෙනා ඔහුට මෙවැනි විපතක් සිදුවේ යැයි කිසිසේත් නොසිතන්නට ඇති. නමුත් ඔවුන් සිදුකළ විහිළුවෙන් අහිංසක ජීවිතයක් අකාලයේ නැතිවුණා. මෙවැනි විහිළුවක් කරද්දී දෙපාරක් සිතිය යුතුයි තමන් කරන දෙයින් මොන වගේ ප්‍රතිඵලයක්ද අත්වෙන්නේ කියන එක ගැන.



නිලන්ති රේණුකා

කොහොම නමුත් අවසානයේ මේ සිදුවීම නිසා අසරණ වුණේ අහිංසක දරු පවුලක්. හේෂාන්ගේ රැකියාව විශාල වැටුපක් ලැබෙන එකක් නොවුණත් ඒ පුංචි වැටුපෙන් ඔහු තමන්ගේ නංගිවයි මල්ලිවයි ජීවත් කෙරව්වා. අයියා කෙනෙක් විදියට තාත්තා නැති අඩුව ඔහු පිරෙව්වා. මේ තරුණයා කොයි තරම් නම් වේදනාවකින් අවසන් හුස්ම හෙළන්නට ඇතිද? බඩවැල් පුපුරා යෑමට තරම් කොයි තරම් පීඩනයක් ඔහුගේ ශරීරයට එල්ල වෙන්නට ඇතිද?

අපි කල්පනාකාරීව කටයුතු නොකළ තැන සිදුවන්නේ විනාශයක්. විපතක්. පසුගිය කාලයේ අවස්ථා ගණනාවකදී මිතුරියන් සමග සෙල්ෆි ඡායාරූප ගන්න දියඇලි ළඟට ගිහින් ලිස්සා වැටීමෙන් තරුණ තරුණියන් කී දෙනෙක් නම් අකාලයේ මියගියාද? පසුගිය ජනවාරි මාසයේදී කලවාන පොතුපිටිය ප්‍රදේශයේදීද දරුවෙක් මියගියේ යකඩ කටුවක් රබර් පටියක් ගැටගසා කරකවමින් සිටියදී රබර් පටිය ගෙලේ එතීමෙන්. 09 හැවිරිදි නෙත්නිඳු ගගන නිම්සර නමැති දරුවෙක් මේ අනතුරෙන් ජීවිතයෙන් සමුගත්තා. ඔහු ගල්ගමුව ප්‍රාථමික පාසලේ සිවුවැනි වසරේ ඉගෙනුම ලබමින් සිටියා.

ඒ වගේම මම දන්නා පවුලක තරුණයෙක්ට ඔහුගේ මිතුරෙක් වායු රයිෆලයකින් විහිළුවට විදීමෙන් ඒ තරුණයාගේ ඇසක් අන්ධ වුණා. මෙවැනි අනාරක්ෂිත විහිළු තමන්ගේ යාළුවෙකුට තබා හතුරෙකුටවත් නොකරන්න අපි හැමෝම වගබලා ගන්න ඕනේ.

හේෂාන්ගේ අම්මා රට ගියේ දරුවන්ට ලස්සන ජීවිතයක් ළඟා කරදෙන්නයි. ඒත් දැන් ඇය මේ දුක කෙසේ දරාගනීවිද? මේ දරු පවුල කොයිතරම් නම් වේදනාවකින් පසුවෙනවා ඇතිද? මව්පියන් දරුවෙක්ව හදන්නේ දහසක් බලාපොරොත්තු හිතේ තියාගෙන. සෙල්ලම් කරලා අකාලයේ ජීවිතය අහිමි කරගන්න නෙවෙයි අම්මා කෙනෙක් දරුවන් හදන්නේ.

දැන් මේ අහිංසක ජීවිතයට පණ දෙන්නට අපි කාටවත්ම බැහැ. මේ අපරාධය සිදුකළ තරුණයන් දෙදෙනාට මොන දඬුවම් දුන්නත් හේෂාන් ජීවිතය හැරගොස් අවසානයි.

මේ මරණයට වගකිව යුතු තරුණයන් දෙදෙනාම 18 හැවිරිදි අය. අවුරුදු 18ක තරුණයන් කියන්නේ ජීවිතයේ හොඳ නරක තේරුම ගන්න පුළුවන් වයසක ඉන්න අය. මොවුන් දුරදිග බලලා කටයුතු කළා නම් අදත් හේෂාන් ජීවතුන් අතර ඉන්නවා.

විනෝදයට කරන විහිළු නිසා ජීවිතවලට එල්ලවන අවදානම ගැන සෑම කෙනකුම දෙවරක් සිතා බලා කටයුතු කළ යුතුයි. තමන්ගෙ ජීවිතය වගේම අනෙකාගේ ජීවිතයටත් ආදරය, කරුණාව වගේම ගෞරවය ලබාදීම අපි හැම කෙනකුගේම යුතුකමක්.

## විහිළුවටවත් මේ වගේ දේවල් කරන්න යන්න එපා




## මට සල්ලි නෑ...

PAGE - 12

දැන් අප මෙම කතාවේ යම් හැරවුම් ලක්ෂ්‍යයකට පැමිණ සිටිමු. එසේ නම් මෙවර 2024 ඉන්දීය මහ මැතිවරණය වෙනුවෙන් තරග කරනු ලබන විවිධ සුවිශේෂ අපේක්ෂකයන් ගැන යමක් සොයා බලමු. එසේම යම් අපේක්ෂකයකුට එවැනි තරගයක් සඳහා ඉදිරිපත් වීමට අවශ්‍ය වන පුද්ගලික ධනයට අදාළ වන තොරතුරුද සොයා බලමු. මෙම මුදල් ප්‍රතිපාදන ගැන යමක් සොයා බැලීම සිදුකළ යුත්තේ මෙම කතාවෙහි මුලින්ම අප සඳහන් කළ ඉන්දියාවේ වත්මන් මුදල් අමාත්‍ය නිර්මලා සීතාරාමන් මහත්මියට මුහුණ දෙන්නට වූ අකරතැබ්බය ගැන සිහිවන විටදීය. ඉන්දියානු රාජ්‍ය නිල වාර්තා සහ මාධ්‍ය වාර්තාවන්ට අනුව එම බලය ලබාගැනීමේ සටනට සල්ලි ගස් සෙලවීම ගැන මෙසේ හෙළිකර ඇත.

★ විශාලතම ලෝක් සභා (පාර්ලිමේන්තු) ආසනයක් තරග කිරීම සඳහා අපේක්ෂකයකුට ප්‍රචාරක කටයුතු සඳහා වැයවන අවම මුදල ඉන්දියානු රුපියල් ලක්ෂ 95ක් පමණ (ශ්‍රී ලංකා රුපියල් කෝටි තුනහමාරක්) වෙයි.

★ දෙවැනි ප්‍රමාණයේ විශාලතම පාර්ලිමේන්තු ආසනයක් තරග කිරීම සඳහා අපේක්ෂකයකුට තම මැතිවරණ මෙහෙයුම් කටයුතු සඳහා වැයවන අවම මුදල ඉන්දියානු රුපියල් ලක්ෂ 75ක් පමණ (ශ්‍රී ලංකා රුපියල් කෝටි 03ක්) වෙයි.

★ මධ්‍යම ප්‍රමාණයේ පාර්ලිමේන්තු ආසනයක් සඳහා මැතිවරණ මෙහෙයුම් වෙනුවෙන් අපේක්ෂකයකුට වැයවන පුද්ගලික ධනය ඉන්දියානු රුපියල් ලක්ෂ 40ක් පමණ (ශ්‍රී ලංකා රුපියල් කෝටි 1.5ක්) වෙයි.

★ කුඩාම ප්‍රමාණයේ පාර්ලිමේන්තු අසුනක් තරග කිරීම සඳහා අපේක්ෂකයකු මැතිවරණ කටයුතු සඳහා වැයකළ යුතු පුද්ගලික ධනය ඉන්දියානු රුපියල් ලක්ෂ 20ක් (ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ 75ක්) වන බව පැවැසෙයි.

මෙහිදී අප අවධානයට ගතයුත්තේ මෙය ඉතා අවම මුදල් ප්‍රමාණයක් බවත්, අපේක්ෂකයාගේ ධනවත්කම්වලට අනුව එම මුදල එම සීමාවන්ද ඉක්මවා යයි. මෙවර ඉන්දියානු මහ මැතිවරණය සඳහා තරග කරනු ලබන සමහර ධනවත් අපේක්ෂකයන්ගේ නම්ගම් සහ ඔවුන්ගේ වත්කම් ගැන ඉන්දියානු මාධ්‍ය වාර්තා දුර්ලභ තොරතුරු රැසක් වාර්තා කර සිටියි. එය සොයා බලමු.

★ ඉන්දියානු මහා ධනකුවේර ව්‍යාපාරික හා දේශපාලක බන්ඩි සාරධි **(Bandi Saradhi)**ගේ වත්කම ඉන්දියානු රුපියල් කෝටි 5,300කි.

★ ඉන්දියානු කොංග්‍රස් මන්ත්‍රී ධනකුවේර ව්‍යාපාරික අයෝධ්‍යා රෙඩ්ඩි **(Ayodhya Reddy)**ගේ වත්කම ඉන්දියානු රුපියල් කෝටි 2,577කි.

★ ස්වාධීන අපේක්ෂක, ව්‍යාපාරික රමේෂ් කුමාර් ෂර්මා **(Ramesh Kumar Sharma)** ගේ ධනවත්කම ඉන්දියානු රුපියල් කෝටි 1,107කි.

★ ලෝක් සභා මන්ත්‍රී නකුල් නාත් **(Nakul Nath)**ගේ වත්කම් ඉන්දියානු රුපියල් කෝටි 700කි.

★ ලෝක් සභා මන්ත්‍රී, කොංග්‍රස් අපේක්ෂක ඩී.කේ. සුරේෂ් **(D.K. Suresh)** ගේ පුද්ගලික ධනවත්කම ඉන්දියානු රුපියල් කෝටි 593කි.


pyramid wilmar
Fortune
SOYA
ඕනෑම
කෑමක් එක්ක
රසට
කන්න...
මිල රු.85/- සිට


Multilac
වර්ණ සවාරිය
Multilac
Premium Sheen Emulsion
Multilac
Weather Guard Ultra
Multilac
Weather Guard Ultra
SUPER BRILLIANT WHITE
Multilac
3 in 1 Water Proofing
Multilac
PREMIUM GLOSS
Enamel Paint
රුපියල් 100,000 ක් වටිනාMultilac නිෂ්පාදන මිලදී ගන්න
ඔබේ අවසන් බිල්පත Multilac PO Box 2024 වෙත තැපැල් කරන්න
මේ අවුරුදු සමයේ ඔබේ නිවස මල්ටිලැක් සමඟ වර්ණවත් කර
මුළු පවුලටම මැලේසියා සවාරියක් දිනා ගන්න!!
වැඩිදුර තොරතුරු සඳහා 070 522 2555 අමතන්න
*කොන්දේසි සහිතයි.


Macktiles
ගෙදරටම අවුරුදු
55% දක්වා
වට්ටම්
අලුත් අවුරුදු සමයේ මැක්ටයිල්ස්
සමඟ ගණුදෙනු කර මුළු පවුලටම
මැලේසියාවේ
සංචාරයක් දිනාගන්න
කොන්දේසි
මාර්තු 01 දින සිට අප්‍රේල් 18 දින දක්වා රු.100,000/- වැඩි සියලු බිල්පත් මෙම තරඟය සඳහා වලංගු වේ.
*කොන්දේසි සහිතයි.
Scan here
ළඟම පිහිටි මැක්ටයිල්ස් ප්‍රදර්ශනාගාර වෙත පැමිණෙන්න.
www.macktiles.com
Macktiles LANKA
CIOB GREEN MARK
SLS 1181
QUALITY ASSURED FIRM ISO 9001
QUALITY ASSURED FIRM ISO 14001

## ක්‍රිෂ්ණමූර්ති කාලාම්ශ ජ්‍යොතිෂ සිද්ධාන්ත ඇසුරෙන්



# 2024 අලුත් අවුරුදු ලග්න පලාපල

## නැකත් අවුල් වුණාට බය වෙන්න එපා

### ලග්න 4කට ධන ලාභ, ලග්න 3කට මංගල යෝග

ක්‍රිෂ්ණමූර්ති පද්ධති කාලාම්ශ ජ්‍යොතිෂ විශේෂඥ
**ගම්පහ ඩබ්.එස්. රාජපක්ෂ**

**2024 සිංහල හින්දු අලුත් අවුරුද්ද උදාවීමට හරියටම ඇත්තේ තවත් දින 07කට නොවැඩි කාලයක්. අපි කවුරුත් බලාගෙන ඉන්නේ උදාවෙන අලුත් අවුරුද්දේ අපේ ජීවිත ආලෝකවත් කරන, වාසනාවන්ත කරන වෙනසක් සිදුවේවි කියලා. ක්‍රිෂ්ණමූර්ති පද්ධති කාලාම්ශ ජ්‍යොතිෂ විශේෂඥ ගම්පහ ඩබ්.එස්. රාජපක්ෂ මහතා Sadisivahini යූටියුබ් නාලිකාවට ඉදිරිපත් කළ 2024 අලුත් අවුරුදු ලග්න පලාපල විස්තරය තුළ අපි හැම කෙනකුගෙ 'ම ලග්නවලට අනුව ලැබෙන සුබ අසුබ ඵලයන් ගැන වටිනා විස්තරයක් ඇතුළත් වෙනවා. එම ලග්න පලාපල විස්තරය 'මව්රට' පාඨක ඔබ වෙනුවෙන් අප මෙලෙස ඉදිරිපත් කරමු.**

## මේෂ ලග්නය

මේෂ ලග්නයෙන් උපන් ඔබගේ ගුරු ග්‍රහයාත්, රවි ග්‍රහයාත් ලග්නයට ගතවෙනවා. ඒ අනුව ග්‍රහයෝ ඉන්නේ ඉස්වුට අනුව බැලුවොත්, රවි ග්‍රහයා කේතුගේ නැකැතේ බව කවුරුත් දන්නවා. නමුත් ගුරු ග්‍රහයා ඉන්නේ කුජගේ නැකැතක. කුජගේ නැකැත කියලා කියන්නේ ලග්නාධිපති. එහෙම නම් ශනි ගැන අපි ඊළඟට බලන්න ඕනේ. ශනි ඉන්නේ ගුරුගේ නැකැතක. ලග්නයයි, ගුරුයි අතර සම්බන්ධතාවක් තියෙනවා. ඒ නිසා තමන්ට යම්කිසි විදියක ධනයක් උපයාග ැනීමේ හැකියාවක් පෙන්නුම් කරලා තියෙනවා. මෙතැන තව ප්‍රශ්නයක් තියෙනවා. පළමු දෙර්කානය පිළිබඳ විමසිලිමත් වුණොත් මෙහි ප්‍රතිඵල ගොඩක් තියෙනවා. දෙවැනි, තුන්වැනි දෙර්කානවලට යනකොට ටිකක් වෙනස් වෙයි. කොහොම කළත් තමන්ට හැකියාවන් පෙන්නුම් කරලා තියෙනවා බුධ වක්‍රව ගමන් කළත්, සිකුරු 12 වැනි භාවයේ (තමන්ගේ ශේෂ බලය ගෙනෙනවා කියන රාශියේ) ඉන්නවා. එතැන උප උපනියාමය 12 වැනි යාමය බැලුවොත් එයත් ශනිට අයිති වෙනවා. කේතු, සිකුරු නියෝජනය කරලා තියෙනවා. එතකොට සිකුරු දෙපැත්තෙන්ම නියෝජනය වන නිසා එයාට අසුබවාදීකමක් ඇතිවෙන්නේ නෑ. සැප සම්පත් ලබාගැනීමේ හැකියාවක් පෙන්නලා තියෙනවා. ඒ වගේම මේ අනුව සුබවාදීකමක් බොහෝ දුරට තියෙනවා. උප්පත්තියෙන් ගෙනාපු නැණ නුවණ විදහා දක්වන්න පුළුවන්කමක් තියෙනවා.

## වෘෂභ ලග්නය

වෘෂභ රාශියෙන් උපන් අයගේ කේන්ද්‍ර සටහනේ අපිට පෙන්නුම් කරනවා ඒ ග්‍රහයෝ කුජ - ශනි යෝගය පස්වැනි භාවයට එන බව. 05 වැනි භාවයට ආවම අපට පෙන්වනවා තමන්ගේ ක්‍රියාකාරීත්වයන් පිළිබඳ 10 වැනි භාවයෙන්. 10 වැනි භාවයේ ඉන්නකොට විදේශ ගමන් පිළිබඳ විශේෂ අවස්ථාවන් උදාවෙනවා. ඒ අනුව වෘෂභ ලග්න හිමියන් ස්වභාවධර්මයේ නිර්මාණ කෙරෙහි වැඩි ඇල්මක් ඇතිකර ගන්නවා. ලෝහමය ද්‍රව්‍ය මෙන්ම ශනිට අයිති දේවල් පිළිබඳ සම්බන්ධතා ඇතිකරගෙන තමන්ගේ ධනය උපයා ගැනීමේ හැකියාවක් පෙන්නුම් කරලා තියෙනවා. කීර්ති ප්‍රශංසා ඇතිකරගෙන ඉදිරියට යන්න පුළුවන්කමක් තියෙනවා. 5 වැනි භාවයට කේතු පැමිණීම එතරම් දුර්වල දෙයක් නෙවෙයි. ඥාන ශක්තීන් දියුණු කරගෙන කටයුතු කරන්න පුළුවන්.

## මිථුන ලග්නය

මිථුන රාශිය කියන්නේ සුබවාදීම ලග්නයක් විදියට හඳුන්වන්න පුළුවන්. මෙකට හේතුව තමයි ධනු, මකර, කුම්භ. කුම්භ රාශිය 9 වැන්නට යනවා. එතකොට ධර්මස්ථානය. ඒගොල්ලෝ ධාර්මික සිතුවිලි ගොඩක් සිතුවිලි ඇතිකරගන්නවා. එහෙම වුණාම ඔවුන්ට පුළුවන් වෙනවා තමන්ගේ ජීවිතය දියුණු කරගෙන සුබවාදී කටයුතු කරගෙන ජීවත් වෙන්න. එහෙම වෙනකොට ඔවුන්ගේ දෝෂ භංග වෙනවා. නමුත් මෙතැනදී ශනිගෙන් දෝෂ තත්ත්වයක් කොහොමත් ඒ අයට නැති බව පෙන්නලා දීලා තියෙනවා. මේ අනුව මිථුන ලග්න හිමියන්ට පුළුවන්කමක් තියෙනවා විදේශගත වෙලා රැකියාවක නිරත වෙන්න. ඇතැම් විට කේන්ද්‍රයේ ශනි දෝෂ තත්ත්වයක් පෙන්නුම් කරනවා නම් ඒ ගැන සැලකිලිමත් විය යුතු වෙනවා. විවාහ යෝජනා බොහෝ ලැබිය යුතුයි. එය අසුබවාදී වෙන්නේ නෑ. ඉක්මන් විවාහ පිළිබඳවත් පෙන්නුම් කරලා තියෙනවා. මිථුන ලග්නයෙන් උපන් අයගේ බුධ ග්‍රහයා 10 වැන්නේ ඉන්න නිසා ඔවුන්ගේ ආයු වර්ධනය වෙනවා. බලවත් රෝග තත්ත්ව පෙන්වන්නෙත් නැහැ. උෂ්ණාධික ආහාර නිසා අසනීපයක් ඇතිවුණොත් හැරෙන්න වෙනත් රෝගයන් පෙන්වන්නේ නැහැ.

## කටක ලග්නය

කටක ලග්නයෙන් උපන් ඔබගේ කේන්දරයේ රවි-ගුරු කියන යෝගය යෙදෙන්නේ 10 වැනි භාවයට. ඒ වගේම ධර්මස්ථානයට බුධ - සිකුරු - රාහු කියන ග්‍රහයෝ එනවා. කුජ - ශනි යෝගය 8 වැන්නට එනවා. මේ අවස්ථාවේදී මේ අයට තරමක අසුබතාවක් ඇතිකරන්න පුළුවන්කම තිබෙනවා. මොකද ඒරාෂ්ටකයක් යෙදෙනවා. ඒරාෂ්ටකයෙන් උපන් ඇතැම් අයට හෝ කේන්දරයේ සුබවාදීව ග්‍රහයන් පිහිටීම මත චන්ද්‍ර-ගුරු යෝග ලග්නයේ හෝ 5 වැන්නේ හෝ 9 වැන්නේ හෝ උපතේදී පිහිටි අයට මෙය ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. නමුත් එහෙම නැති අයට ඒරාෂ්ටක යෝග යක් බලපානවා. මොකද කුම්භ රාශියේ ශනි ගමන් කරනවා කුජත් සමග. එහිදී තමන්ට අනතුරු, කරදර, දුක්වලට පත්වෙන්න ඉඩ තියෙනවා. ඒ ගැන සැලකිලිමත්ව තමන්ගේ ආරක්ෂාව සලසාගෙන කටයුතු කළ යුතු වෙනවා. මෙතැනදී පෙන්වනවා සඳු ග්‍රහයා ගමන් කරන්නේ 12 වැනි භාවයේ. 12 නිවේදනය කරන්නේ කුජ - රවි කියන ග්‍රහයන්. රවිගේ පාලනය යටතේ උප උප නියාමයෙන් පෙන්නුම් කරන නිසා ලග්න හිමියාට එතරම් අසුබතාවක් පෙන්වන්නේ නැහැ. මොකද රවි, ගුරුත් සමග 10 වැනි භාවයේ ඉන්න නිසා. කීර්ති ප්‍රශංසා ලැබෙන විදියට, තමන්ගේ ආත්ම ගෞරවය රැකගෙන ඉදිරියට යන්න පුළුවන්කම කටක ලග්න හිමියන්ට පුළුවන්කම තියෙනවා. ඒරාෂ්ටක අපලය බලපෑවොත් පමණයි ප්‍රශ්නයක් මතුවෙන්නේ.

## සිංහ ලග්නය

සිංහ ලග්නයෙන් උපන් අයගේ චන්ද්‍රයා 11 වැනි භාවයට එනවා. කුජ-ශනි 7 වැන්නට එනවා. මෙතැනදී සිදුවෙන්නේ බාධක ස්ථානයක් බවට පත්වීම. කුම්භ රාශියට ශනි සහ කුජ ආවාම විවාහය, ව්‍යාපාර කටයුතු සහ මිතුරන් අතරින් තමන්ට අසුබ ප්‍රතිඵල ඇතිවීම සිදුවෙනවා. ඒ නිසා කල්පනාකාරීව එම බාධක මැඩපවත්වා ගන්නා කටයුතු කළ යුතු වෙනවා. රවි - ගුරු ග්‍රහ යෝග යක් 9 වැනි භාවයට යෙදෙනවා. ඒ නිසා පුළුවන් තරම් ගුණයහපත් සහ ආගමානුකූල ජීවිතයක් ගතකරනවා නම් මේ දෝෂය දුරු කරගන්න පුළුවන්. මෙහෙම තිබුණොත් විවාහයේදී නම් ශනිගේ දෝෂය භංග කරගන්න අවශ්‍යයි. කුජගේ ගැළපීම තිබුණොත් තමයි එය පටන්ගත යුත්තේ. 12 වැනි භාවයේ අධිපති කියන්නේ මීන රාශියේ අධිපතියා. ධර්මස්ථානයේ ඉන්න නිසා 8 තියෙන ගොඩක් දෝෂ මගහැරී යනවා. තමන්ගේ සැරපරුෂ ගති තියෙනවා නම් ඒවා දුරුකර ගන්න වෙනවා. ඒ වගේම කිසිවකුටවත් යටත් නොවන ස්වභාවයන් තියෙනවා නම් එයත් මගහැරගත යුතු වෙනවා.

සිංහ ලග්නයෙන් උපන් අයට බරපතළ දෝෂ තත්ත්වයන් මේ නව වසර උදාවත් සමග පෙන්නුම් කරන්නේ නෑ. විවාහයට බලපාන බාධකත් පෙන්නුම් කරන්නේ නැහැ. මේවා ඇතැම් විට උත්පත්ති කේන්දරයට අනුව පාලක ග්‍රහයන්ගේ ස්වභාවය වෙනස් වෙනවා දෙර්කානයෙන් දෙර්කානයට. විදේශගත වීමට සූදානමින් සිටින අය තමන්ගේ කේන්දරය පරීක්ෂා කරගෙන දෝෂ භංග කරගෙන ඒ ගමන යායුතු වෙනවා. නැතිනම් කරදර ඇතිවීමේ ඉඩක් පවතිනවා. ඒ වගේම රාහු සහ කේතුගේ පිහිටීම ගැනත් සැලකිල්ලක් දක්වන්න.

## කන්‍යා ලග්නය

කන්‍යා රාශියෙන් උපන් අයගේ රවි-ගුරු යෝගය 8 වැන්නට එනවා. කුජ, රාහු, සිකුරු කියන ග්‍රහයන් 7 වැනි භාවයට එනවා. කේතු ලග්නගත වෙනවා. චන්ද්‍රයා 10 වැනි භාවයට එනවා. මේ අනුව හිතලා බැලුවොත් පළමු දේ තමයි ලග්නාධිපති ග්‍රහයා 7 වැනි භාවය නියෝජනය කරනවා. වෙනත් ආකාරයකට කුජ සමග ඇතිකරගන්නා යෝගය 10 වැනි භාවයට ඇවිල්ලා තියෙනවා. ඒ අනුව කන්‍යා ලග්න හිමියන්ට රුධිරගත රෝග වැලඳීමේ අවදානමක් තිබෙනවා. නමුත් එම රෝග බරපතළ වෙන්නේ නැහැ. විවාහ වෙලා ඉන්න අය සැලකිලිමත් විය යුතුයි. දරු සම්පත් සඳහා බාධක ඇතිවෙන්න පුළුවන්. ඒ ගැන අවධානයෙන් කටයුතු කරන්න කියලා මතක් කරනවා. අනාගතයේ යහපත් බව පෙන්නුම් කරලා තියෙනවා. චන්ද්‍රයා බලවත් වෙලා ඉන්නේ මිථුනයේ ඉන්නේ කුජගේ නැකැතක වුණාට, කුජ කියන ග්‍රහයා 6 වැනි භාවයේ සිටිනවා. බුධ නියෝජනය කරනවා 10 වැනි භාවය. නමුත් රවි ග්‍රහයා එතැනදී යෝගයක් ඇතිකරගන්නවා මේෂය මත. රවි සඳු අතර යෝගයක් සම්බන්ධව උප උප නියාමයෙන් පෙන්නුම් කරලා තියෙන නිසා එතැන තිබෙන දෝෂ තත්ත්වය බොහෝ දුරට භංග වෙනවා. මේ නිසා ඔබේ අනාගතය සුබවාදී වෙනවා. ගුණධර්ම ආරක්ෂා කරමින් දැහැමි ජීවිතයකට යොමු වුණොත් වඩාත් හොඳ ප්‍රතිඵල ලබාගන්න පුළුවන් බවත් මතක් කරනවා.

## තුලා ලග්නය

තුලා ලග්නයෙන් උපන් අයට බරපතළ දෝෂ තත්ත්වයන් පෙන්නුම් කරන්නේ නැහැ. සුබවාදී බවක් ඇතිකරනවා. බොහෝ දෙනෙක් විදේශගත වෙන්න, විදේශ රැකියා කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. තමන්ගේ අධ්‍යාපන කටයුතු, විවාහය, ගේ දොර ඉඩකඩම් පිළිබඳවත් අපේක්ෂා හැම කෙනෙක් ගාවම තියෙනවා. හොඳට හිතාබලා, ආගමානුකූලව, යුක්ති ධර්මයට අනුව කටයුතු කරද්දී ඔබේ කාරණා සුබවාදීව ඉටුවන බව කිව යුතුයි. 9 වැනි භාවය නිවේදනය කරනවා රවි ග්‍රහයා. රවි මේ රාශියට අවතීරණ වුණා විතරයි. මැයි මාසයේ මුල් දින 15 තුළ තමන්ගේ සිතුම් පැතුම් ඉෂ්ට කරගැනීමට හැකියාවක් ඇතිවෙනවා. විදේශ ගමන්වලට ඒ කාලය ඉතා සුබයි. බොහෝ විට තමන්ගේ කේන්දරයේ දශාව අනුව විදේශගත වීමකට හේතු වාසනාව වැඩිපුර තියෙනවා නම් මේ දවස් ටික ඒ සඳහා යොමුවීම අනිවාර්යයි. වෙනත් බාධක කිසිවක් පෙන්වන්නේ නැහැ. තුලා රාශියේ අයට ශනිගේ දෝෂ තත්ත්වයන් එතරම් බලවත්ව පවතින්නේ නැහැ. කුජ-ශනි යෝගයක් 5 වැනි භාවයේ පෙන්වනවා. 5 වැනි භාවයේදී එම යෝගය යෙදෙනකොට බොහෝ විට තමන්ට ශනි ග්‍රහයා බලවත් වෙනවා. කුජත් බලවත් වෙනවා. ඒ නිසා අධ්‍යාපනය, විදේශගත වීම යනාදිය සඵල වෙනවා.

## වෘශ්චික ලග්නය

කුජ-ශනි කියන ග්‍රහයන් දෙන්නා 4 වැනි භාවයට එනවා. විවාහයට හොඳ කෙනෙක් ලැබෙන්න පුළුවන් බව පෙන්වනවා. එක පාරටම හිත ගිහින් විවාහයක් සිදුකරනවාට වඩා විමසිලිමත්ව කල්පනා කරලා ඒ ගැන තීරණ කළ යුතු වෙනවා. බලවත් අසුබ බවක් පෙන්නුම් කරන්නේ නෑ. ගුරු ග්‍රහයා රෝගී ස්ථානගත වෙලා ඉන්නවා. නමුත් ස්නායු රෝගවලට හේතුවක් ලෙස එය පෙන්නුම් කරන්නේ නැහැ. අධ්‍යාපන කටයුතු කරන අයට යහපත් අනාගතයකට හේතු වාසනා තියෙනවා. වෘශ්චික රාශියේ අයටත් විදේශ ගමන් සාර්ථක වෙන්න පුළුවන්. සඳු ජල රාශිගත වීම සාමාන්‍යයෙන් පළමු වතාවට විදෙස්ගත වන අයට සුබයි. ඒ නිසා බොහෝ දුරට යහපත් ජීවිතයකට හේතු වෘශ්චික රාශියෙන් පෙන්වලා තියෙනවා. දැඩි අසුබ බවක් සඳහන් වෙන්නේ නැහැ.

## ධනු ලග්නය

ධනු ලග්නයෙන් උපන් අයගේ කේන්දරයේ 6 වැනි භාවයට සඳු යනවා. මෙතැනදී සඳුගේ ක්‍රියාකාරීත්වය ධනු රාශියේදී අයහපත් බවක් ඇතිකරන්නේ නැහැ සිකුරුගේ භාවයක් වුණාට. මොකද සිකුරු ග්‍රහයා ඉන්නේ සඳුගේ රාශියක. ශනි නිවේදනය කරනවා. එයාගේ උප ග්‍රහයා වෙන්නේ ගුරු. ලග්නාධිපති උප ග්‍රහයා වන නිසා බරපතළ රෝග වැනි දේ ඇතිවෙන්නේ නැති බව පළමුවෙන්ම කියනවා. ඒ වගේම 5 වැනි භාවයට ගුරු ඇවිදින් තියෙනවා. 5 වැනි භාවයේ ක්‍රියාත්මක වෙන්නේ ගුරු කියන උප ග්‍රහයාත්, සිකුරු උප ග්‍රහයාත් අතර සම්බන්ධතාවක් පෙන්වනවා.

ගුරු කියන ග්‍රහයාට සිකුරුගේ නැකැතක නිසා ඒ අතර හොඳ සම්බන්ධතාවක් ඇතිවෙනවා. ඒ නිසා ආයුෂ වර්ධනය වෙනවා, බුද්ධිය වැඩිවෙනවා, විභාගවලින් ඉහළ සාමාර්ථ ලබාගන්න පුළුවන් වෙනවා. නමුත් ඒ සඳහා උනන්දුවෙන් පාඩම් කටයුතුවල යෙදීමත් අත්‍යාවශ්‍ය වෙන බව සිහිපත් කරනවා. ඔවුන්ට වැඩි දෝෂ තත්ත්වයන් පෙන්වන්නේ නැහැ.

ධනු ලග්න හිමියන්ට මේ යෝගයත් සමග කලකිරීම් ස්වභාවයක් ඇතිවෙන්නත් පුළුවන්. කුජ-ශනි යෝගයක් 11 වැනි භාවයේ තිබෙන නිසා විවාහයේ ප්‍රමාදයක් ඇතිවෙන්න ඉඩ තියෙනවා. ඒ වගේම විවාහ ප්‍රමාද වීමක් සිදුවෙන්නත් පුළුවන්. නමුත් තමන්ගේ ආත්මය දියුණු කරගෙන හැකියාවක් පෙන්නුම් කරලා තියෙනවා. ආධ්‍යාත්මික ගුණ වගාවත් වැඩිකරගන්න ඕනේ.

## මකර ලග්නය

මකර ලග්නයෙන් උපන් අයගේ ලග්නයේ දෙවැනි භාවයේ කුජගේ සම්බන්ධතාව පෙන්නුම් කරනවා. රවි හා ගුරු කියන යෝගය මේ ස්ථානයට බොහොම හොඳයි. විවාහයට අසුබ සහ බාධක බොහොමයක් පෙන්නුම් කරනවා. තමන්ගේ කේන්දරයේ කුජ ග්‍රහයා 7 වැනි භාවයේ හිටියොත්, කුජ ග්‍රහයා ලග්නගත වෙලා හිටියොත් ඒ අය ඉක්මන් විවාහවලට යොමුවෙනවා. බලවත් රෝග තත්ත්වයන් පෙන්නුම් කරන්නේ නැහැ. අනාගතය සුබවාදී විදියට සැලසුම් කරන්නත් පුළුවන්. 9 වැනි භාවයට කේතු පැමිණ තිබෙන නිසා ඥානකාරක බවකින් අනාගතය දියුණු කරගන්න ආගමික කටයුතුවලට මුල්තැන දී කටයුතු කරන්න කියන එක සිහිපත් කරනවා.

## කුම්භ ලග්නය

කුම්භ ලග්නයෙන් උපන් අයගේ කුජ - ශනි යෝගය ලග්නගත වෙනවා. සහජ නිර්මාණ කිරීමේ හැකියාව, ගුප්ත ශාස්ත්‍ර පිළිබඳ උනන්දුවක් තිබෙනවා නම් මේ යෝගය යෙදෙද්දී ඒවා මතුවෙලා එනවා. ඒක 5 වැනි භාවයෙනුත් පෙන්නුම් කරලා තියෙනවා. 5 වැනි භාවය මිථුන රාශියට අයිතියි. එතැන රවි නිවේදනය කරලා තියෙනවා. කුම්භ ලග්න හිමියන්ට විවාහය සම්බන්ධ ගැටලු මතුවෙන්න ඉඩකඩ තියෙනවා. මෙවැනි කේන්දරවලදී පොරොන්දම් හොඳින් ගළපා ගැනීම ඉතා වැදගත් වෙනවා. විවාහය නිසා සිතට බරක්, කනස්සල්ලක් වගේ දෙයක් දැනෙන්න පුළුවන්. මොකද රවි ග්‍රහයා ලග්නගත වීම නිසා. කොහොම වුණත් සැම අතකින්ම දියුණුව සලසා ගන්න වාසනාව ඇති බවත් සඳහන් කළ යුතුයි.

## මීන ලග්නය

මීන ලග්නයෙන් උපත සිදුවුණාම කුජ-ශනි යෝගය 8 වැන්නට යනවා. එහිදී රවි, බුධ, සිකුරු, රාහු ලග්නගත වෙනවා. කුජ 7 වැන්නට එනවා. චන්ද්‍රයා 3 වැනි භාවයට එනවා. ගුරු 2 වැනි භාවයට එනවා. ගුරු 2 වැනි භාවයේ ඉන්නකොට බොහොම කලාත්මක නිර්මාණ, ග්‍රන්ථ කර්තෘවරයෙක් වෙන්න පුළුවන්. නිර්මාණශීලීත්වයෙන් ධනය උපයා ගැනීමේ හැකියාවක් සහිතයි. තමන්ගේ දශාවත් එක්ක එම යෝග යෙදුණොත් එම හැකියාවන් වඩාත් වර්ධනය වෙනවා. දෙර්කානය අනුව පොඩි වෙනසක් වෙන්න පුළුවන්. ඒකත් ලග්නයට යෙදුණොත් ඔබ එතරම් අසුබ බවක් පෙන්වන්නේ නැහැ. විවාහ කටයුතුවලදී තරමක අසුබ බවක් පෙන්නුම් කරනවා. මීන ලග්න හිමියන්ට විදේශ රැකියා සම්බන්ධ අවස්ථා තියෙනවා. ඒ වගේම අධ්‍යාපනය සාර්ථක කරගැනීමේ වාසනාවත් මේ අයට තියෙනවා. බලවත් රෝග වැලඳීමේ ඉඩක් නැහැ. ආයුෂ වර්ධනය වෙනවා. කලාත්මක අංශයේ රැකියාවන් කිරීමේ අවස්ථාවත් උදාවෙනවා.



සැකසුම
චානක ලියනගේ

# 71 කැරැල්ල අමතක කරන්න බෑ



## මේ ටික දැනට කියවන්න හොඳම ටික ළඟම එනවා



ජ්‍යෂ්ඨ මාධ්‍යවේදී ධර්මන් වික්‍රමරත්න

**වසර 1971 අප්‍රේල් ඇරඹුණු අප්‍රේල් කැරැල්ලට 2024 අප්‍රේල් 05 වැනිදාට වසර 53කි. අප්‍රේල් කැරැල්ල පිළිබඳ මෙතෙක් පළවූ ග්‍රන්ථ සංඛ්‍යාව පනහකට ආසන්නය. එහෙත් ඔබ හොඳත් කතාව සොයා මේ ලියුම්කරු දිස්ත්‍රික් 17ක සංචාරය කර, 1971 කැරැලිකරුවන් 150කට අධික සංඛ්‍යාවක් ඔවුන්ගේ නිවෙස්වලට ගොස් ඉකුත් වසර කිහිපය ඇතුළතදී එනම් 2010 සිට 2019 දක්වා හමුවුණි. එකී තොරතුරු ඇතුළත් පිටු 750ක පමණ ග්‍රන්ථයක් දැන් සකස්වෙමින් පවතී. මෙහි ඇත්තේ කරුණු එක්කළ කෙටි ලිපියකි. ලියුම්කරු සමග සාකච්ඡාවලට එක්වූ ඇතැමුන් අද ජීවතුන් අතර නැත. එහෙත් ඔවුනගේ හඬපට සහ ඡායාරූප ලියුම්කරු සතුය. කිහිප දෙනකුම අප්‍රේල් කැරැල්ල පිළිබඳ අදහස් දක්වා ඇත්තේ ඉතිහාසයේ ප්‍රථම වරටය. ඡායාරූප ගනු ලැබුවේද ලියුම්කරු විසිනි.**

ලාංකේය දේශපාලනයේ ගමන්මග වෙනස් කළ පළමු වෙඩිමුරය වූයේ 1971 අප්‍රේල් කැරැල්ලය. එය මෙහෙය වූයේ රෝහණ විජේවීරගේ නායකත්වයෙන් යුත් ජනතා විමුක්ති පෙරමුණ (ජවිපෙ)ය. රට පුරා පොලිස් ස්ථාන 92කට ජවිපෙ අප්‍රේල් 05 වැනිදා රාත්‍රියේ රාජ්‍ය බලය ලබාගැනීම අරමුණ ඇතිව පහර දුන්හ. නිදහසින් පසු සන්නද්ධ අරගලයක් මගින් රාජ්‍ය බලය ලබාගැනීමට දැරූ ප්‍රථම උත්සාහයද මෙය විය. අප්‍රේල් කැරැල්ලේදී කැරැලිකරුවන් පහර දුන් පොලිස් ස්ථාන 92ක අතරින් 57ක් විනාශ කළ අතර, දෙණියාය, උඩුගහ, රාජාංගනය, කතරගම සහ වරකාපොල යන පොලිස් ස්ථාන 05 යටත් කර ගත්තේය. තවත් පොලිස් ස්ථාන 43ක් තාවකාලිකව ඉවත් කරගෙන තිබිණි.

අප්‍රේල් කැරැල්ලේදී පොලිස් නිලධාරීන් 37ක් සහ හමුදා නිලධාරීන් 26ක් ජවිපෙ කැරැලිකරුවන් අතින් ඝාතනයට ලක්විය. කැරැලිකරුවන් මරාදමන ලද සිවිල් වැසියන් සංඛ්‍යාව 41කි. සමගි පෙරමුණ රජය මගින් ප්‍රකාශ කළ නිල දත්ත අනුව මරාදමන ලද කැරැලිකරුවන් සංඛ්‍යාව 1,200කි. එහෙත් මරාදමන ලද කැරලිකරුවන් සංඛ්‍යාව 5,000කට ආසන්න බව කියති. අත්අඩංගුවට ගත් සංඛ්‍යාව 18,000ක් පමණ වූ අතර, ඉන් 4,200ක් පමණ පොදු දේශපාලන සමාව යටතේ බාරවූ අය වේ. කැලණිය සහ ජයවර්ධනපුර සරසවි තාවකාලික සිර කඳවුරු බවට පත්විය. අප්‍රේල් කැරැල්ලෙන් පසු පරීක්ෂණ කොමිෂන් සභා 04ක් මගින් 1972 අගෝස්තු 10 සිට 1976 නොවැම්බර් 04 දක්වා කැරැල්ලේ මහ නඩුව ඇතුළු පරීක්ෂණ 140ක් පවත්වන ලදී. එයට චෝදනා ලැබූ චූදිතයන් සංඛ්‍යාව 3,908කි. ඉන් 3,014 කොමිෂන් සභා හමුවට ගෙන ආ අතර 894 දෙනකු අත්අඩංගුවට ගත නොහැකි විය. අත්හිටුවූ සිර දඬුවම් මත නිදහස් කළ සංඛ්‍යාව 2,492කි. බරපතළ සිරදඬුවම් ලැබූ කැරැලිකරුවන් ගණන 390කි.

ජවිපෙ නායක රෝහණ විජේවීර ඇතුළු 05 දෙනකුට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම විය. නිදොස් කොට යැවූ කැරැලිකරුවන් ගණන 104කි. මහ නඩුවේදී 41 දෙනකුට එරෙහිව නඩු පැවරිණි. අප්‍රේල් මහ නඩුවේ තීන්දුව 1974 දෙසැම්බර් 20 වැනිදා ලබාදුන් අතර, විත්තිකරුවන් 41 දෙනාගෙන් 4ක් නිදහස්වූ අතර, සුසිල් සිරිවර්ධන, එස්.ඩී. බණ්ඩාරනායක සහ ටී.ඩී. සිල්වාට අත්හිටුවූ සිරදඬුවම් නියම විය. විජේවීර දිවි ඇති තෙක් හිරේය. බරපතළ වැඩ ඇතිව සිරදඬුවම් 28 දෙනකුට නියම විය.

කැරැල්ලේ නායක රෝහණ විජේවීර 1971 මාර්තු 13 වැනිදා පස්වරුවේදී අම්පාරේදී අත්අඩංගුවට ගනු ලැබීය. ඔහු සමග කෙලී සේනානායක, නිශ්ශංක, ප්‍රේමරත්න, ලාල් සෝමසිරි සහ ඇල්පිටියේ ඒ. ප්‍රේමසේනද අත්අඩංගුවට ගෙන මඩකළපු බන්ධනාගාරයට දමා මාර්තු 15 වැනිදා උදෑසන 7.30ට කොළඹ වැලිකඩ බන්ධනාගාරයට ගෙන එනු ලැබුවේ පොලිස් අධිකාරි රංජිත් සේනානායක විසිනි. පසුව විජේවීර, ප්‍රේමරත්න සහ ලාල් සෝමසිරි යාපනය බන්ධනාගාරයට ගෙනයන ලදී. ප්‍රේමරත්න සහ ලාල් සෝමසිරි 1971 මාර්තු 31 වැනිදා කල්මුණේ උසාවියට ඉදිරිපත් කළ විට ඇපපිට නිදහස් විය. විජේවීර එයට පෙර දින එම දෙදෙනාට කියා සිටියේ පහර දෙනවා නම් 500ක පමණ පිරිසක් තමා නිදහස් කරගැනීමට එවන ලෙසට සනත්ට සහ පියතිලකට දන්වන ලෙසය. වඩුතන්ත්‍රීගේ සිරිල් නොහොත් ලාල් සෝමසිරි බටපොල සිය නිවෙසේදී මේ ලියුම්කරුට පැවැසූ පරිදි විජේවීර එදා කැරැල්ල ආරම්භ කිරීමට දිනයක් සහ වේලාවක් තීරණය කර පහර දෙන ලෙසට පණිවුඩයක් කීවේ නැත. විජේවීර කියා ඇත්තේ පහර දෙනවා නම් 500ක් තමා බේරාගැනීමට එවන ලෙසය. අප්‍රේල් 05 වැනිදා වන විටත් විජේවීර සිටියේ යාපනය බන්ධනාගාරයේය.

ඔස්මන්ගේ අම්මා වන සීලවතී ද සිල්වා කියා සිටියේ යාපනය හිර ගෙදරදී තමා විජේවීර බැලීමට ගිය අවස්ථාවේදී පහර නොදී භේද අතහැර කටයුතු කරන මෙන් රෝහණ විජේවීර දුන් පණිවුඩය තමා සනත් සහ ලොකු අතුල ඇතුළු පක්ෂයේ නායකයන්ට දැනුම් දුන් බවය. වනාතමුල්ලේදී ඔස්මන් සිල්වා හමුවූ ලියුම්කරු එම කරුණු සනාථ කරගත්තේය. එවක රජයේ සොලිස්ටර් ජනරාල්වරයා සහ කැරැල්ල මැඩලීමෙහිලා සුවිශේෂ කාර්යභාරයක් කළ ඉයන් වික්‍රමනායක සීලවතීගෙන් ඉල්ලා සිටියේ යාපනයේ හමුවූ අවස්ථාවේදී කැරැල්ල ආරම්භ කරන ලෙසට විජේවීර කියූ බවට කටඋත්තරයක් දෙන ලෙසය. ගිනි තැබූ නිවෙස සදාදෙන බවටද, පුතුන් නිදහස් කර රැකියා ලබාදෙන බවටද ඉයන් වික්‍රමනායක පොරොන්දු වුවද තමා බොරු කීවේ නැති බවද සීලවතී පසුව කියා සිටියාය. ලාල් සෝමසිරි 1971 මැයි 31 වැනිදා දෙන ලද කටඋත්තරයේදී විජේවීර කියන ලද කරුණු ඉයන් වික්‍රමනායක විකෘති කර තිබූ බව ලාල් සෝමසිරි, මෙම ලියුම්කරුට අවධාරණය කළේය. ලොකු අතුල ඇතුළු ඇතැමකු කියන්නේ 1971 මාර්තු 13 අම්පාරේදී විජේවීර ස්වේච්ඡාවෙන්ම අත්අඩංගුවට පත්වූ බවකි. එහෙත් මහ නඩුවේ 26 වැනි සැකකරුවකු වූ එදා විජේවීරගේ සමීපතමයකු වුවද ජවිපෙ 2 වැනි කැරැල්ලේ ඝාතන ලැයිස්තුවේ සිට දිවි බේරාගැනීමට සමත්වූ විජේවීර සමග අම්පාරේදී අත්අඩංගුවට ගත් පස්දෙනා පවසනුයේ සිය කැමැත්තෙන් විජේවීර අත්අඩංගුවට පත්වූවා යැයි කීම දැඩිව ප්‍රතික්ෂේප කරන බවය.

අනපේක්ෂිත ලෙස අත්අඩංගුවට පත්වීමේ සිද්ධිය විකෘති කිරීමට කැමැති නැති බවද ඔවුහු කියා සිටියහ. අම්පාරේ 1971 මාර්තු 13 විජේවීර අත්අඩංගුවට ගැනීම පිළිබඳව සිදුවූයේ කුමක්දැයි සොයා බැලීමට මේ ලියුම්කරු බටපොල ලාල් සෝමසිරිගේ නිවෙසටත්, අම්පාරේ ප්‍රේමරත්නගේ නිවෙසටත්, කරන්දෙණියේ ප්‍රේමසේනගේ නිවෙසටත්, හෝමාගම නිශ්ශංකගේ නිවෙසටත් ගියේය. එමෙන්ම විදේශගතව සිටි කෙලී සේනානායක සමගද දුරකතනයෙන් සම්බන්ධ විය.

වසර 1971 මාර්තු 15 වැනිදා මඩකළපුවේ සිට කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට ගෙන ආ බවද එදින උදෑසන 11.00 පැමිණි ඔස්මන්ගේ අම්මා සහ කුමානායකට විජේවීර තමා ඉදිරිපිටදී කියා සිටියේ, ලොකු අතුල සහ සනත්ට ප්‍රශ්න අමතක කරගෙන පසුබසින ලෙසත්, ආයුධ හංගා දිස්ත්‍රික්ක මාරුකරන ලෙසත් කෙලී සේනානායක ප්‍රකාශ කර ඇත. අප්‍රේල් කැරැල්ලේ පහරදීමේ අවසාන තීරණය ගත්තේ 1971 අප්‍රේල් 02 වැනිදා ගංගොඩවිල විද්‍යෝදය සරසවියේ සංඝාරාමයේදීය. නම දෙනකුගෙන් යුත් එම නායකත්ව මණ්ඩලයේ මූලසුන දැරුවේ පියතිලකය. අප්‍රේල් 05 වැනිදා රාත්‍රී 11.30ට පොලිස් ස්ථානවලට පහර දියයුතු යැයි වැඩි ඡන්දයෙන් තීරණය විය. එය 6ට 3ක් වශයෙන් බෙදුණු තීන්දුවකි. එම රැස්වීමට සහභාගි වූ පස්දෙනකුද ලියුම්කරුගේ සාකච්ඡාවට එක්විය.

මේ තීරණයට පෙර ජවිපෙ නායකයන් 09 දෙනකු රැස්වී තීරණයක් ගෙන තිබිණි. ඒ අනුව තීරණය වූයේ තවදුරටත් පහරදීම ප්‍රමාද වන්නේ නම් 1971 අප්‍රේල් 04 වැනිදා රාත්‍රී 10.00ට පොලිස් ස්ථානවලට එකවර පහර දීමටය. ඒ අනුව එම තීරණය දින කිහිපයකට පෙර රට පුරා දිස්ත්‍රික් ලේකම්වරුන්ට දැනුම් දෙමින් තිබිණි. අප්‍රේල් 05 වැනිදා උදේ වැල්ලවාය පොලිසියට පහර දෙන්නේ වැරදි විදුලි පණිවුඩයකින් නොව මෙම අලුතින් ගත් තීරණය ඔවුන්ට සන්නිවේදනය කර නොතිබීමෙනි. එහෙත් 1971 අප්‍රේල් 05 වැනිදා රාත්‍රී පහරදීමට ගත් තීරණය අනිකුත් සියලු ස්ථානවලට ගොස් තිබිණි. අප්‍රේල් 03 වැනිදා සවස බටපොල අතුලගේ නිවෙසේදී ලාල් සෝමසිරිට කැරැල්ලේ දෙවැනි නායක සනත් නියම කළේ, අම්පාර උහනට ගොස් මොනරාගල දිස්ත්‍රික් නායක දොඩම්ගහවෙල ප්‍රේමසිරි හමුවී පහරදෙන්නේ අප්‍රේල් 04 වැනිදා රාත්‍රී 10 නොව අප්‍රේල් 05 වැනිදා 11.30ට ලෙස වේලාව වෙනස් වී ඇති බවය. පණිවුඩය ලබාදීමට අප්‍රේල් 04 වැනිදා හිමිදිරි පාන්දරම නුවර හරහා අම්පාරට යැමට ගිය ලාල් සෝමසිරිට නුවර බස් නැවතුම්පොළේදී නිශ්ශංක ප්‍රේමරත්න හමුවිය. එවිට වේලාව දවල් 12.30 පමණ විය. ප්‍රේමරත්න විසින් සෝමසිරිට එහිදී කියා සිටියේ වහාම යළිත් විද්‍යෝදය සරසවියට ගොස් පියතිලක හමුවන ලෙසට පියතිලක දන්වා ඇති බවත්, තමා වහාම මොනරාගල දිස්ත්‍රික් නායක දොඩම්ගහවෙල ප්‍රේමසිරි හමුවීමට ගොස් පහරදෙන්නේ අප්‍රේල් 04 රාත්‍රී නොව 5 වැනිදා රාත්‍රී බවට දැනුම් දෙන බවත්ය. කැරැල්ලට සහභාගි නොවී එදිනම සැඟවුණු ප්‍රේමරත්න එම පණිවුඩය මොනරාගල නායකයාට දැනුම් දුන්නේ නැත. එය තමා පසුපස සැකකටයුතු පුද්ගලයෙක් පැමිණීම නිසා මොනරාගලට නොගොස් අම්පාරට පැමිණි බව අම්පාරේ ප්‍රේමරත්න පිළිගත්තේය. වැල්ලවාය පොලිස් ස්ථානයට 1971 අප්‍රේල් 04 රාත්‍රී එල්ල කළ ප්‍රහාරය එම සන්නිවේදන සම්බන්ධීකරණයේ දුර්වලතාවක ප්‍රතිඵලයකි.

ප්‍රේමරත්නගේ දැනුම්දීම අනුව 1971 අප්‍රේල් 04 දහවල් 12.30ට නුවරින් කොළඹ බලා ආ ලාල් සෝමසිරි මහරගමට ගොස් විද්‍යෝදය සරසවියේදී පියතිලක හමුවිය. එදින රාත්‍රී කෑම කා සරසවියේ නවාතැන් ගත් සෝමසිරි 1971 අප්‍රේල් 05 උදෑසන ඊබට් සිල්වා බසයට නැගී 60 දෙනකු සමග යාපනය සිංහල මහා විද්‍යාලයට පැමිණෙන විට රාත්‍රී 9.00 පමණ වී තිබිණි. නායකයන් හද්දිය හිමි සහ කරාටේ සැමසන්ය. පිළියන්දල මධ්‍ය විද්‍යාලයේ සිසුන් 16ක්ද කණ්ඩායමට අයත් විය. දුම්රියෙන්ද පැමිණ යාපනයේ නාග විහාරයේ සිටි පිරිස සමග එක්ව කඩ වසා තිබූ බැවින් රාත්‍රී ආහාරයට බිස්කට් පමණක් කා බෝම්බ දෙක බැගින් ගෙන බන්ධනාගාරයට සහ පොලිසියට පහරදීමට ඔවුහු ගියහ. ප්‍රහාරයක් ද එල්ල කළහ. මේ සියලු කරුණු කාරණා ඉතිහාසයට එක්වී 2024 අප්‍රේල් 05 වැනිදාට හරියටම වසර 53කි.

එම කාලය තුළදී අප්‍රේල් කැරැල්ල පිළිබඳ පළවූ පතපොතද දුසිම් 04කට ආසන්නය. පුවත්පත් ලිපිද ප්‍රමාණයෙන් අතිවිශාලය. එහෙත් එම කතා එකිනෙකට පරස්පරය. එසේත් නොමැති නම් තම දෘෂ්ටිකෝණයන් අනුව ලියන ලද ලේඛනය. නැතිනම් පෙර පළකරන ලද පොත් සහ ලිපිවලින් එකතු කරගත් කරුණුය. 1971 අප්‍රේල් කැරැල්ල පිළිබඳ මවිසින් නිකුත් කරන නවතම ග්‍රන්ථය මෙතෙක් කිසිදු පුවත්පතක පළවී හෝ ග්‍රන්ථයක් වශයෙන් ප්‍රකාශයට පත්කොට හෝ නැත. අප්‍රේල් කැරැල්ලෙන් වසර 53කට පසු එළිදකින එම ග්‍රන්ථය සැකසීම මේ ලේඛකයා කැරැල්ලේ

PAGE - 06



